DOI: 10.31357/fhssmph.2008.00078

# විසිවන සියවසෙහි ශ්‍රී ලංකාවේ පාලි පද්‍ය සාහිත්‍යය (1900 - 1999)

මැස්ටියේ උපනන්ද හිමි

ලියාපදිංචි අංකය : GS/HU/1931/2003

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති පරීක්ෂණය සඳහා පාලි විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි.

## කර්තෘගේ ප්‍රකාශය

මේ ශාස්ත්‍රීය නිබන්ධය මහාචාර්ය ආරියපාල පෙරේරා මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

2008/12/17

## උපදේශක නිර්දේශය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
08 AUG 2008
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

17.12.2008

.............................

අත්සන

මහාචාර්ය ආරියපාල පෙරේරා

උපදේශක

# පිළිගැන්වීම

මා පැවිදි බිමට ඇතුළත් කොට

නිසි කළ සිප් සතර ලබාදෙමින්

යහමග යවා ජීවිතය ආලෝකමත් කළ

ගරු ගෝනදුවේ ගුණානන්ද හිමිපාණන් වහන්සේටත්,

ගරු පරණගම පුඤ්ඤරතන හිමිපාණන් වහන්සේටත්

මා දයාබර මෑණියන් සහ පියාණන්ටත් .......

# උපකාරානුස්මෘතිය

විසිවන සියවසේ පාලි පද්‍ය සාහිත්‍යය නම් වූ දර්ශනපති උපාධි නිබන්ධය සඳහා පර්යේෂණ කටයුතුවල නිරතවීමේ දී අවශ්‍ය මාර්ගෝපදේශයන් ලබා දෙමින් මෙය ඉතා මැනවින් නිම කිරීම සඳහා මහත් ශක්තියක් වූ උපදේශක තුමන් වන ආචාර්යය ආරියපාල පෙරේරා ඇදුරුතුමන්ට මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.

එමෙන්ම මෙම නිබන්ධ කාර්යයෙහිලා මා දිරිමත් කරමින් අවශ්‍ය උපදෙස් ලබාදීමට ක්‍රියා කළ වත්මන් පාලි හා බෞද්ධ අධ්‍යයනාංශාධිපති ආචාර්ය නායිම්බල ධම්මදස්සි හිමිපාණන් වහන්සේට මාගේ ප්‍රණාමය පුද කරන අතර ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණන්, හිටපු අධ්‍යයන අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.ඒ. වීරසේන මහතාණන් ඇතුළු ගිහි පැවිදි ආචාර්ය මණ්ඩලයේ සැම දෙනාට මාගේ කෘතඥතාව පලකර සිටිමි.

එමෙන්ම සදොස් තැන් නිදොස් කොට පෙන්වමින් අවශ්‍ය උපදෙස් ලබාදීමට ක්‍රියා කළ මහාචාර්ය වෝල්ටර් මාරසිංහ මහතාණන්, කථිකාචාර්ය මීපිටියේ සීලරතන හිමිපාණන්, මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර මහතාණන් ඇතුළු සියලු දෙනාට මාගේ ප්‍රණාමය පුදකර සිටිමි.

මෙම නිබන්ධය පරිගණක ගත කිරීමේ දී එය ඉතා මැනවින් ඉටු කර දුන් ගංගොඩවිල යුනික් කොමියුනිකේෂන් ආයතනයේ නිලන්ති මෙනෙවිය ඇතුළු මේ සඳහා අතහිත සියලු දෙනාට මාගේ කෘතඥතාව හිමිවිය යුතුය.

# හැඳින්වීම

බුද්ධ කාලයෙහි ප්‍රබල ආගමික භාෂාවක් මෙන්ම ව්‍යවහාරික භාෂාවක් වශයෙන් ද පැවති පාලිය මහින්දාගමනයෙන් පසු ලංකාද්වීපයෙහි ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. වට්ටගාමිණී අභය රාජ්‍ය සමයෙහි ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් අනතුරුව සාහිත්‍යයික ලිඛිත භාෂාවක් වශයෙන් ද වැඩෙන්නට විය. කාව්‍ය ගුණ හා අලංකාර පාදක කර ගනිමින් විවිධ වූ ගද්‍ය පද්‍ය කෘතිහු අනුරපුර, පොළොන්නරු යුගයන්හි බිහි වූ. ඒ අතරින් ජිනචරිතය, ජිනාලංකාරය, සමන්තකූට වර්ණනාව, උපාසක ජනාලංකාරය, දාඨාවංසය, ආදී ඛණ්ඩ කාව්‍ය කැපී පෙනේ. මෙවැනි සම්භාව්‍ය පාලි පද්‍ය සාහිත්‍යයක් නිර්මාණය වීමෙහි ලා එකල පැවති උසස් අධ්‍යාපන තත්ත්වය මෙන්ම ආගමික, දේශපාලනික හා ආර්ථික හේතූන් ද බලපෑ බව මූලාශ්‍රයන්ගෙන් අනාවරණය වේ.

එහෙත් මහනුවර සමයෙහි පැන නැගුණු අභ්‍යන්තරික හා බාහිර හේතු සාධක පාලි සාහිත්‍යයෙහි වර්ධනයට බාධකයක් විය. සංඝරාජ මාහිමියන් තුළ පාලි භාෂාව පිළිබඳ තිබූ දෘෂ්ටිය හා උන් වහන්සේගේ ක්‍රියාකාරීත්වය සියලු බාධක ජය ගැනීම සඳහා හේතු විය. සරණංකර මාහිමියන්ගේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායෙහි පාලි භාෂාව ට ප්‍රමුඛස්ථානයක් හිමි විය. බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමේ කාර්යයේ දී පාලි භාෂාව සම්බන්ධයෙන් සරණංකර සංඝරාජ හිමියන්ගේ අවධානය යොමු වූ ආකාරය සංඝරාජ සාධුචර්යාවෙන් හෙළි වේ.

සංඝරාජ පදවිය ලත් සරණංකර නාහිමියෝ සුවිශේෂී අධ්‍යාපන රටාවක් අනුගමනය කරමින් පාලි භාෂාව සහ ධර්ම විනය උගත් මනා ශිෂ්‍ය පරම්පරාවක් ගොඩනගා බුද්ධ ශාසනය චිරස්ථායි කිරීමට සමත් වූහ. පාලි බස හැදෑරීමේ පහසුව උදෙසා රූපමාලා, රූපමාලා වර්ණනා, ශබ්ද මාලාව, සුධීරමුඛ මණ්ඩනය, සද්ධවිනිච්ඡය, කාරක පුප්ඵමංජරී, ආඛ්‍යාත රූපමාලා ආදී ග්‍රන්ථ ගණනාවක් සම්පාදනය කොට ශිෂ්‍යයන් තුළ පාලි බස ඉගැන්මට නව උද්‍යෝගයක් ගොඩ නැගූහ. ස්වකීය ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාව ලංකාව පුරා

විහිද යමින් පාලි අධ්‍යාපනය සාර්ථක ලෙස සංවර්ධනයට පත් කිරීම නිසා බුදු දහමත් පාලි භාෂාවත් යළිත් චිරස්ථායි බවට පත් විය.

එකී පාලි පද්‍ය සාහිත්‍යයේ ප්‍රබෝධය සඳහා සංඝරාජ මාහිමියන්ගේ ක්‍රියාකාරීත්වයෙහි ප්‍රතිඵල මෙන්ම එම යුගයෙහි සමාජ පසුබිම ද බලපෑ බව කිව යුතු. යුරෝපීය ආධිපත්‍යයෙන් ක්‍රමයෙන් මිදෙමින් පැවැති මෙම කාල පරිච්ඡේදයේ දී රොබට් චාර්මස් ආදී ඉංග්‍රීසි ජාතීන්ගේ පවා සහාය පාලි සාහිත්‍යයේ වර්ධනය සඳහා ලැබිණි. යම් තරමට සාමකාමී දේශපාලන වාතාවරණයක් පැවැතීම ද දෙස් විදෙස් හි ප්‍රචලිත අධ්‍යාපන ආයතන දෙකක් වන විද්‍යෝදය විද්‍යාලංකාර යන ගුරුකුලද්වයෙන් අධ්‍යාපනය ලැබූ බොහෝ පැවිදි පඩිවරු ලංකාව පුරාම ශාඛා පිරිවෙන් අරඹා පාලි භාෂාවත් ත්‍රිපිටක ධර්මයත් අතිරේක භාෂා ශාස්ත්‍රයනුත් නඟා සිටුවීමට ක්‍රියා කළහ.

සරණංකර සංඝරාජයන්ගෙන් ඇරඹුණු පාලි භාෂා සාහිත්‍ය පිළිබඳ පුනරුදය විසිවන සියවස මැද භාගය වන විට පෙරදිග ලෝකය පුරාම සාර්ථක ලෙස ප්‍රචලිත වෙමින් පැවතිණි. මෙබඳු වාතාවරණයක් මත මහාකස්සප චරිත, සාරිපුත්ත චරිතය, ගාමිණී චරිතය, ජිනවංසදීපය, සාසවංසදීපය, අභිනව සාසනවංසය ආදී පද්‍ය සමූහයක් බිහිවූ බව පෙනේ. මෙම ග්‍රන්ථ පාලි පද්‍ය සාහිත්‍යය ට එක්වීමත් සමඟම විසිවන සියවසෙහි පාලි පද්‍ය සාහිත්‍යය තුළ නව ප්‍රවණතා රැසක් ඇති විය. රචනා ශෛලියෙහි හා භාෂා ලක්ෂණයන්හි පෙනෙන නව ප්‍රවණතා පහත සඳහන් ආකාරයට වර්ගීකරණයට භාජනය කළ හැකිය.

(i) අලංකාරවාදයට ගරු කිරීම.

(ii) ගාඪ ශෛලියෙන් යුක්ත වීම.

(iii) සරල සුගම ශෛලීන් වෙනස් වීම.

(iv) අනුප්‍රාස බහුල වීම.

(v) පරෝක්ෂා පද යොදා තිබීම.

(vi) කෘදන්ත පද භාවිතය සුලභ වීම.

(vii) පෙළ බසෙහි අනන්‍යතාව විනාස වීම.

(viii) දුෂ්කර බන්ධන ශෛලිය වර්ධනය වීම.

(ix) සංස්කෘත භාෂා ලක්‍ෂණ.

(x) මිශ්‍ර භාෂා ලක්‍ෂණ.

කෙසේ වෙතත් මෙම සියවෙසහි පාලි පද්‍ය ග්‍රන්ථයන්හි රචනා ශෛලිය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ශබ්ද රසය හා අර්ථ රසය යන උභය රසයම වහනය වන අයුරින් ග්‍රන්ථ රචනයට පෙළඹී ඇති බව පෙනේ. අදහස් ප්‍රකාශ කිරීම සඳහා යොදා ගන්නා ප්‍රධානතම අවිය හා මාධ්‍යය වන භාෂාව මහින් කාව්‍ය නිර්මාණයක දී සුවිශේෂී මෙහෙයක් ඉටු කරන බව අවබෝධ කරගත් මෙම යුගයෙහි පාලි පද්‍ය ග්‍රන්ථ කතුවරු භාෂාව නිවැරදිව භාවිත කරමින් සංස්කෘත සාහිත්‍යයේ විද්‍යමාන පද්‍ය කාව්‍යකට නො දෙවැනි කාව්‍ය ග්‍රන්ථ නිර්මාණය කිරීමට සමත් වූහ.

දක්‍ෂ සිත්තරකු වර්ණ හා රේඛා උචිත පරිදි යොදා චිත්‍රයක් නිර්මාණය කරන්නාක් මෙන් ප්‍රතිභාපූර්ණ කවියා භාෂාව මාධ්‍යය කර ගනිමින් ශබ්දාර්ථ දෙකෙහි සුසංයෝගයෙන් මනහර කාව්‍යයක් නිර්මාණය කරයි. එම භාෂාව පාදක කරගනිමින් රචිත විශිෂ්ට ගණයෙහි ලා සැලකිය හැකි කෘතීන් කිහිපයක් මෙම සියවසෙහි නිර්මාණය වී ඇත. එනම්, මහා කස්සප චරිතය, ජිනවංශ දීපය, සාරිපුත්ත චරිතය ආදී කෘතීන්ය.

සංස්කෘතික කවීහු තමන්ගේ පාණ්ඩිත්‍යය පෙන්වීම සඳහා අනුගමනය කළ යමක බන්ධන හා දුෂ්කර බන්ධන වැනි කාව්‍ය රීතින් ද අනුගමනය කර ඇති බවට පහත දක්වෙන නිදසුන සාක්ෂ්‍ය දරයි.

*කපීතනා සෝකතමාල නීපා*

*කපීතනා සෝකතමාල නීපා*

*කපීතනා සෝකතමාල නීපා*

*කපීතනා සෝකතමාල නීපා*

බොහෝ ගාථා සංස්කෘත කාව්‍යාලංකාරාදියෙන් පිරිපුන් බවක් දක්නට ඇත. මේ නිසාම ඉහත සඳහන් භාෂා ලක්‍ෂණ රාශියක් පාලි සාහිත්‍යයට එකතු වූ බව කිව යුතුය.

සංගීත ශාස්ත්‍රයේ ස්වර නමින් හැඳින්වෙන නාද නියමිත සම්ප්‍රදායක් අනුව නැංවීමෙන් රසවත් බවක් ඇති වේ. සංගීතය යනු එයයි. එය මෞලික වර්ණ හා ද්විතීයික වර්ණයන් ක්‍රමානුකූල ලෙස ආලේපනය කිරීමෙන් මනහර සිත්තමක් මැවේ. එමෙන් ම අකුරු එකතුවෙන් හැදෙන වචන ක්‍රමවත් පරිදි ගැලපීමෙන් ගද්‍ය හා පද්‍ය කාව්‍ය බිහි වේ. සංගීතයත් චිත්‍රයත් රසවත් හැඟීම් ඇති කරන්නා සේ පරිපූර්ණ සාහිත්‍ය කෘතියක් මඟින් පාඨකයා තුළ රසැති හැඟුම් ජනිත කරවයි. උක්ත ලක්‍ෂණයන් වර්ධනය කිරීම සඳහා එළිසම භාවිතය, අනුප්‍රාස භාවිතය, වෘත්ත භාවිතය, ශබ්ද ධ්වනිය, ගීතවත් භාවය යන ලක්‍ෂණ ඇතුළත් කර ඇති බව පෙනේ. පශ්චාත් කාලීන පාලි පද්‍ය ග්‍රන්ථයන්ට සාපේක්‍ෂ ව නව ප්‍රවණතාවක් ලෙස මේ ලක්‍ෂණය ඉස්මතු කරමින් පාලි මහාකාව්‍ය ග්‍රන්ථ කිහිපයක් මේ යුගයේ දී රචනා කරන ලදී.

විසිවන සියවසෙහි පාලි පද්‍ය කෘතින්හි පෙනෙන තවත් ප්‍රවණතාවක් ලෙස සංස්කෘත සංකල්ප රූපවල ආභාසය දක්‌ විය හැකිය. සංකල්ප රූප යනු පාඨකයාගේ පසිඳුරන් මාර්ගයෙන් ඔහුගේ මනසට පිවිස ඔහු තුළ භාව ප්‍රබෝධයක් ඇති කිරීමට සමත් නියත වාක් චිත්‍ර යයි. ප්‍රධාන වශයෙන් ඊට ඇතුළත් වන්නේ උපමා හා රූපකයන්ය. එහෙත් ස්වභාවෝක්තිය ඇතුළු සෙසු අලංකාර විශේෂ පද මේ ගණයෙහිලා සැලකිය හැකිය. බුද්ධිගෝචර වූත් හෘදය ගෝචර වූත් හැඟීම් වේගවත් ලෙස හා සංක්‍ෂිප්තව ඉදිරිපත් කළ හැක්කේ සංකල්ප රූප තුළින් බව ටී. ඊ. හියුම්, රිචඩ් ඇල්ඩින්ටන් යන කවීහු ද ප්‍රකාශ

කර ඇත. ත්‍රිපිටක සාහිත්‍යයෙහි පෙනෙන ගුණවාචී පද සහ නිදහස් සරල උපමාවන් යොදාගෙන ප්‍රස්තුතය වර්ණනා කිරීමේ ක්‍රමයෙන් ව්‍යුක්තව සංස්කෘත සාහිතයෙහි පෙනෙන සංකල්ප රූප භාවිත කර ඇති බවට සාධකයක් ලෙස ශුද්ධෝදන රාජ වර්ණනා වේ දක් වෙන පහත සඳහන් ගාථාව නිදසුන් වශයෙන් ඉදිරිපත් කළ හැකිය.

*භස්මීකතාබීල විපක්ඛතනරින්දකට්ඨො*
*කෝධානලො සරසමීරන භාවිතොපි*
*නිබ්බායි පග්ඝරිතප්ප ජලෙහි යස්ස*
*ලොලම්බි ලෝචනසටෙහී විපක්ඛරීනං*

නමුත් අවශ්‍ය අවස්ථාවල දී ත්‍රිපිටක සාහිත්‍යයේ එන සංකල්ප රූප භාවිතයෙන් ද බැහැර වී නොමැති බව පහත නිදසුන මඟින් හෙළි වේ.

*යස්මා බන්ධෙ පජහති ජිනෝ භික්ඛවේ හන්දදානි*
*ආමන්තේමි නියතභිදුරා සබ්බ සංඛාරා ධම්මා*
*සම්පාදේථාත්‍යමිතමතිමා අප්පමාදේන තුම්හේ*
*පඛ්‍යාකාසි භගවතා මයං පච්ඡිමා හෝති වාචා*

මිනිස් සිරුරේ නිසරු බව, අස්ථාවර භාවය බුදුන් වහන්සේ නිරන්තරයෙන් දේශනා කරන ලද බැව් ත්‍රිපිටකය පුරා එන බුද්ධ වචනයෙන් පැහැදිලි වේ. පෙළ ග්‍රන්ථයන්හි ආභාසය ලත් මෙම යුගයේ පාලි පද්‍ය කතුවරුන්ට බුදු දහමේ ඉගැන්වෙන මෙබඳු උපදේශයන්ගෙන් ද මිදීමට නොහැකි වූ බව යථෝක්ත නිදසුන් සාක්ෂ්‍ය දරයි.

විශේෂයෙන් යථොක්ත සඳහන් කරුණු සාකච්ජා කිරීමට ප්‍රධාන පරිච්ඡේද හතරක් යටතේ මාගේ නිබන්ධයෙහි කරුණු පෙළගස්වා ඇත.

විසිවන සියවස තුළ විශාල පද්‍ය ග්‍රන්ථ ප්‍රමාණයක් විද්‍යමාන වන අතර ඊට අතිරේකව ගද්‍ය කාව්‍ය, කෝෂ කාව්‍ය හා ව්‍යාකාරණ කාව්‍ය ද අන්තර්ගතය. මෙවැනි සුවිශේෂී සාහිත්‍යයකට විසිවන සියවස උරුමකම් කීම සඳහා බලපෑ හේතු සාධක ප්‍රථම පරිච්ඡේදය යටතේ සාකච්ඡාවට බඳුන් කොට ඇත.

දෙවැනි පරිච්ඡේදය යටතේ විසිවන සියවසේ රචිත පාලි පද්‍ය ග්‍රන්ථයන් හඳුන්වා ඒවායෙහි අන්තර්ගත විෂය කරුණු යටතේ වර්ගීකරණයට ලක්කොට ඇත.

තෙවැනි පරිච්ඡේදය යටතේ පාලි පද්‍ය ග්‍රන්ථයන්හි රචනා ශෛලිය හා භාෂා ලක්ෂණ පිළිබඳව අවධානය යොමු කොට ඇති අතර, සිව්වන පරිච්ඡේදය මඟින් තත් ග්‍රන්ථයන්හි භාවිත අලංකාර විධි රස නිෂ්පත්තිය සඳහා භාවිත ක්‍රමවේද විමසීමට ලක් කර ඇත.

**නිබන්ධ මාතෘකාවේ විෂය ක්ෂේත්‍රය**

මාගේ නිබන්ධ මාතෘකාවේ විෂය ක්ෂේත්‍රය වන්නේ විසිවන සියවසේ ශ්‍රී ලංකාවේ රචිත පාලි පද්‍ය කෘතීහු පමණකි.

# අධ්‍යයනයේ අරමුණු

විසිවන සියවසෙහි පාලි පද්‍ය සාහිත්‍යය යන මැයෙන් ඉදිරිපත් කරනු ලබන නිබන්ධයෙහි පහත සඳහන් අරමුණු සාධනය කර ගැනීමට අපේක්ෂිත ය.

(i) විසිවන සියවස තුළ ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය පාලි පද්‍ය සාහිත්‍යයේ විද්‍යාමාන වන්නේ දැයි විමසීම.

(ii) එකී පාලි පද්‍ය සාහිත්‍ය සඳහා බලපෑ ශාස්ත්‍රීය පසුබිම හඳුනා ගැනීම.

(iii) තත් යුගයේ රචිත පාලි පද්‍ය ග්‍රන්ථ හා ඒවායේ අන්තර්ගතය සාකච්ඡා කිරීම.

(iv) විසිවන සියවසෙහි ශ්‍රී ලංකාවේ පාලි පද්‍ය ග්‍රන්ථයන්හි නිර්මාණාත්මක ලක්ෂණ හඳුනා ගැනීම.

(v) රචනා ශෛලිය, භාෂා ලක්ෂණයන්හි විවිධතා හඳුනා ගැනීම.

# ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය

මූලාශ්‍රය අධ්‍යයනය (Study of Sources)

සම්මුඛ සාකච්ඡා ක්‍රමය (Interview Method)

මෙහිදී අධ්‍යයනය කරන ලද මූලාශ්‍රයන් ප්‍රධාන වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රය ද්විතීයක මූලාශ්‍රය වශයෙන් දෙවදරුම් වේ.

**ප්‍රාථමික මූලාශ්‍රයයෝ**

පාඨ ග්‍රන්ථ

අටුවා ග්‍රන්ථ

ප්‍රකරණ ග්‍රන්ථ

**ද්විතියක මූලාශ්‍රයයෝ**

විචාරාත්මක ග්‍රන්ථ

සංස්කරණ ග්‍රන්ථ

විශ්ව කෝෂ

ලිපි ලේඛන

වාර සඟරා

සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදයෙහි දී මෙම විෂය කෙරෙහි විශේෂඥතාවක් දක්වන විද්වතුන්ගේ මහපෙන්වීම ලබා ගෙන ඇත.

# හැකුළුම්

| | | |
|---|---|---|
| අ. ච. | - | අලංකාර චන්ද්‍රිකා |
| අ. නි. | - | අංගුත්තර නිකාය |
| අ. පා. | - | අපදාන පාලිය |
| ඉ. පා. | - | ඉතිවුත්තක පාලිය |
| ක. ව්. | - | කව් සිළුමිණ |
| කාව්‍ය. | - | කාව්‍යාදර්ශය |
| කා. සේ. | - | කාව්‍ය සේඛරය |
| කු. සම්. | - | කුමාර සම්භවය |
| ඛු. පා. කු. සි. | - | ඛුද්දක නිකායේ ඛුද්දක පාඨ කුඩු පෙළ හා සිංහල අනුවාදය |
| ච. බු. | - | චරියා පිටක බුද්ධවංස පාලි |
| චු. පා. | - | චුල්ලවග්ග පාලි |
| ජින. වං. | - | ජිනවංසදීපය |
| ථෙ. පා. | - | ථෙරගාථා පාලි |
| ද. අ. | - | දහම් අමා |
| දී. නි. | - | දීඝනිකාය |
| දී. නි. ස. | - | දීඝනිකාය සංඥාපනය |
| දි. වං. | - | දීප වංසය |
| ධ. ප. | - | ධම්ම පදය |
| ධ. ස. | - | ධම්ම සංභණිය |
| ප. ස. | - | පපඤ්චදීපිකා සංඥාපනය |
| පා. ඉ. සි. ශ. | - | පාලි ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂය |
| පා. නි. | - | පාලි නිඝණ්ඩුව |
| පා. පා. | - | පටිසම්භිදා පාලි |
| පා. ව්‍යා. | - | පාලි ව්‍යාකරණ |

| | | |
|---|---|---|
| පා. ස. | - | පාරාජිකා සංඥාපනය |
| පැ. සි. | - | පැරකුම්බා සිරිත |
| පූ. ජී. | - | පූජිත ජීවිත |
| පො. පා. ස | - | පොළොන්නරු යුගයේ පාලි සාහිත්‍යය |
| ප්‍රභාෂා | - | ප්‍රභාෂා ශ්‍රී සෝමරතන සාහිත්‍ය අංකය |
| ප්‍රේ. පා. | - | ප්‍රේතවත්‍ථු පාලි |
| ප්‍රා. ශා. | - | ප්‍රාචීන ශාස්ත්‍රීය සංග්‍රහය |
| බු. ත්‍රි. ග්‍ර. | - | බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා වෘත්තාප්තය |
| බු. ප. ආ. සු. | - | බුදු දහම පරිසරය හා ආධ්‍යාත්මික සුන්දරත්වය |
| බු. වෘ. | - | බුද්ධ ජයන්ති වෘතාන්තය |
| මු. බ. ස. | - | මුඛමත්‍ථදීපනී සංඥාපනය |
| ම. නි. | - | මහානිද්දෙස පාලි මහාවග්ග පාලි |
| මාගධී | - | මාගධී ශාස්ත්‍රිය සංග්‍රහය |
| මු. දා. | - | මුවදෙව්දාවත |
| ල. පා. සා. | - | ලංකා පාලි සාහිත්‍යය |
| ලෝ. ස. | - | ලෝවැඩ සහරාව |
| වං. පු. | - | වංසත්‍ථ පකාසිනිය |
| වි. අ. පු. | - | විද්‍යෝදය ශ්‍රී අමරවංස ප්‍රණාමාඤ්ජලී |
| වි. ධ. ශා. | - | විද්‍යෝදය ධර්ම ශාස්ත්‍රීය සංග්‍රහය |
| වි. පි. | - | විදුලකර පිරිවන්පති යක්කඩුවේ නාහිමි |
| වි. වි. ම. | - | විදුරුපොල පියතිස්ස මාහිමි |
| වි. පි. ස. | - | විද්‍යාංලකාර පිරිවෙණ ශත සංවත්සරය |
| වු. ද. | - | වුත්තෝදය |
| වු. ටී. | - | වුත්තොදය ටීකාව |
| වෛ. සා. | - | වෛදික සාහිත්‍යය |
| ශ්‍රී. ධ. අ. | - | ශ්‍රී ධර්මාරාම සාහිත්‍ය අංකය |

| | | |
|---|---|---|
| ශ්‍රී. ල. අ. | - | ශ්‍රී ලංකානන්ද ශාස්ත්‍රීය අංකය |
| ස. දා. | - | සසඳාවත |
| ස. නි. ස. | - | සංයුත්ත නිකාය සංඥාපනය |
| ස. බෞ. | - | සමීපාතීතයේ බෞද්ධාචාර්යයෝ |
| සම්. ශා. | - | සම්භාෂා ශාස්ත්‍රීය සංග්‍රහය |
| සං. සිං. ශ. | - | සංස්කෘත සිංහල ශබ්දකෝෂය |
| සං. සා. | - | සංස්කෘත සාහිත්‍යය |
| සා. ද. | - | සාහිත්‍ය දර්පණය |
| සා. දා. | - | සාරදා ශාස්ත්‍රිය සංග්‍රහය |
| සා. වි. | - | සාහිත්‍යය විවේචනය |
| සා. වි. ප්‍ර. | - | සාහිත්‍ය විචාර ප්‍රදීපය |
| සි. අ. ස. | - | සිංහල අංගුත්තර නිකාය අටුවා සංඥාපනය |
| සි. පා. අ. | - | සිංහල පාලි ආකාරාදිය |
| සි. ම. | - | සිංහල මහාවංශය |
| සි. මැ. | - | සිංහල මැදුම් සඟිය |
| සි. ල. | - | සියබස්ලකර |
| සිං. සා. | - | සිංහල සාහිත්‍ය වංසය |
| සිං. සා. නැ. | - | සිංහල සාහිත්‍යයේ නැගීම |
| සු. ච. | - | සුමංගල චරිතය |
| සු. නි. | - | සුත්ත නිපාතය |
| සු. බෝ. | - | සුබෝධාලංකාරය |
| සෝ. හේ. මැ. | - | සෝමාවතී හේවිතාරණ මැතිණිය |
| සෘග් | - | සෘග්වේදය |
| සෞ. නන්. | - | සෞන්දරානන්දය |
| හි. නා. හා. | - | හික්කඩුවේ නායක හාමුදුරුවෝ |
| හේ. මැ. | - | හේවාවිතාරණ මැතිණිය |

# පටුන


| | පිටු අංකය |
|---|---|
| කෘතඥ ප්‍රකාශය | II |
| උපදේශක නිර්දේශය | II |
| පිළිගැන්වීම | III |
| උපකාරානුස්මෘතිය | IV |
| හැඳින්වීම | V - X |
| අරමුණු | XI |
| ක්‍රමවේදය | XII |
| හැකුළුම් | XIII - XV |
| පටුන | XVI - XVIII |

**පළමුවැනි පරිච්ඡේදය**

**පාලි සාහිත්‍යයේ වර්ධනය සඳහා බලපෑ හේතු විමසීම** **1 - 37**

1.1 විසිවන සියවසේ පාලි සාහිත්‍යය

1.1.1 ගද්‍ය කාව්‍ය

1.1.2 පද්‍ය කාව්‍ය

1.1.3 චම්පූ කාව්‍ය

1.1.4 ව්‍යාකරණ ග්‍රන්ථ

1.1.5 කෝෂ ග්‍රන්ථ

1.2 විසිවන සියවසෙහි පාලි සාහිත්‍යයෙහි වර්ධනය සඳහා බලපෑ හේතු සාධක

1.2.1 සම්භාව්‍ය විද්‍යාස්ථානයන්හී ක්‍රියාකාරීත්වය

1.2.1.1 විද්‍යෝදය පිරිවෙණ

1.2.1.2 විද්‍යාලංකාර පිරිවෙන

1.2.2 ශාස්ත්‍රීය ග්‍රන්ථ සංස්කරණය

1.2.2.1 ත්‍රිපිටක ග්‍රන්ථ සංස්කරණය

1.2.2.2 අටුවා සහ ටීකා ග්‍රන්ථ සංස්කරණය

1.3 ප්‍රාචීන භාෂෝපකාර සමාගම පිහිටුවීම

1.4 විද්වත් පඬිවරුන්ගේ ක්‍රියාකාරීත්වය

**දෙවැනි පරිච්ඡේදය**

**විසිවන සියවසේ පාලි පද්‍ය සාහිත්‍යයේ විෂය ක්ෂේත්‍රය** 38 - 125

2.1 ඉතිහාසය

2.2 බුද්ධචරිත කාව්‍ය

2.2.1 බුද්ධ චරිත කාව්‍ය ඉතිහාසය හැඳින්වීම

2.2.2 විසිවන සියවසේ බුද්ධචරිත කාව්‍ය

2.3 භක්ති කාව්‍ය

2.3.1 භක්ති කාව්‍ය ඉතිහාසය

2.3.2 විසිවන සියවසේ පාලි භක්ති කාව්‍ය

2.4 ප්‍රශස්ති කාව්‍ය

2.4.1 ප්‍රශස්ති කාව්‍ය ඉතිහාසය

2.4.2 විසිවන සියවසේ පාලි ප්‍රශස්ති කාව්‍ය

2.5 වංශ කථා

2.5.1 වංශ කථා ඉතිහාසය

2.5.2 විසිවන සියවසේ පාලි වංස කථා කාව්‍ය

2.6 චරිත කථා කාව්‍යය

2.6.1 චරිත කථා කාව්‍ය ඉතිහාසය

2.6.2 විසිවන සියවසෙහි පාලි චරිත කථා කාව්‍ය

2.7 උපදේශ සාහිත්‍යය

2.7.1 උපදේශ සාහිත්‍ය ඉතිහාසය

2.7.2 විසිවන සියවසෙහි පාලි උපදේශ කාව්‍යය

2.8 සන්දේශ කාව්‍ය

2.8.1 සන්දේශ කාව්‍ය ඉතිහාසය

2.8.2 විසිවන සියවසේ පාලි සන්දේශ කාව්‍ය

2.9 විවිධ විෂයීගත පාලි පද්‍ය ග්‍රන්ථ

**තෙවැනි පරිච්ඡේදය**

**විසිවන සියවසෙහි පාලි පද්‍ය සාහිත්‍යයෙහි,**

**රචනා ශෛලිය හා භාෂා ලක්‍ෂණ** **126 - 150**

3.1 රචනා ශෛලිය

3.2 භාෂා ලක්‍ෂණ

3.2.1 සංස්කෘත භාෂා ලක්ෂණ

3.2.2 පර්යාය පද මිශ්‍රිත භාෂා රටාව

3.2.3 ත්‍රිපිටකයෙහි විද්‍යමාන සරල භාෂා ශෛලිය

**සිවුවැනි පරිච්ඡේදය**

**නිර්මාණාත්මක වැදගත්කම** **151 - 193**

4.1 අලංකාර භාවිතය

4.2 දුෂ්කර බන්ධන ශෛලිය

4.3 රස නිෂ්පත්තිය සඳහා භාවිත ක්‍රමවේදය

4.3.1 වෘත්ත භාවිතය

4.3.2 ශබ්ද ධ්වනිය

4.3.3 එළිසම භාවිතය

4.3.4 අනුප්‍රාස භාවිතය

4.3.5 ගීතවත් භාවය

4.4 චරිත නිරූපණය

නිගමන

ග්‍රන්ථාවලිය